පාඨක අවධානය වැඩියෙන් ආකර්ෂණය කර ගැනීම උදෙසා, භාවාතිෂය ලෙසින් පුවත් සිරස්තල සහ පුවත් අන්තර්ගතයෙන් ලිවීම,

ඇතැම් මාධ්‍ය මඟින් යොදා ගන්නා භාවිතාවකි. කෙසේ නමුත් මෙය කෙතරම් යෝග්‍ය භාවිතාවක්ද යන්න ගැටලුකාරී වේ.

විශේෂයෙන්ම පුවතක් භාවාතිෂය විසින් ඉදිරිපත් කිරීම ඔස්සේ, එම පුවතට අදාළ වන සමාජ ගැටලු, එම පුවතට ප්‍රස්තුත සිදුවීමෙහි වන වැදගත් තොරතුරු පාඨක අවධානයට හසු නොවී යැමට ඉඩකඩ තිබේ.

මීට අමතර "සුරූපී" වැනි විශේෂණයන් ඔස්සේ පුවතකට අදාළ නොවන කාන්තා බාහිර රූපය ඉස්මතු කර දැක්වීම ද කෙතරම් යෝග්‍ය මාධ්‍යකරණයක්ද යන්න වුව, පාඨක අප නැගිය යුතු පැනයකි.

ලැගුම්හලකට පැමිණි 67 හැවිරිදි පුද්ගලයෙකුගේ මළසිරුර හමුවීම පිළිබඳ පුවතක් ලංකාදීප සහ දිවයින පුවත්පත් (ජූනි 10, 2022) තුළ පළවී තිබුණු ආකාරය, භාවාතිෂය සිරස්තලයන්ට සහ භාවාතිෂය නොවන සිරස්තලයට නිදසුන් ලෙස ගනිමු.

ඒ අනුව, සිදුවීම පිළිබඳ වඩාත් හොඳින් තොරතුරු ඔබට සන්නිවේදනය වන සිරස්තලය ලෙසින් ඔබ තෝරාගන්නේ කුමක්ද?

1) ලැගුම්හලෙන් සිරුර හමුවූ විශ්‍රාමික නිලධාරියාගේ මරණයට විවෘත තීන්දුවක් - ලංකාදීප

2) සුරූපී කතගේ දැහලිල්ලට විශ්‍රාමිකයාගේ පණ ගිහින් - දිනමිණ

දැනුවත් මාධ්‍ය පරිශීලනයක් වෙනුවෙන්, භාවාතිෂය නොවන මාධ්‍යකරණයක නිරත වෙමු.

භාවාතිෂය නොවන මාධ්‍යකරණයක නිරත වෙමු.